## Abstract 31

# ලක්දිව බුද්ධ ප්‍රතිමාවේ චීවරයේ විචිත්‍රත්වය

**ඩී. බී. එම්. එස්. බස්නායක,**
(ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර - බෞද්ධ සංස්කෘතිය),
*sureshbasnayake@gmail.com*

ලක්දිව ප්‍රතිමාකරණය කෙරෙහි අවධානය යොමු කරන විට විවිධ කාලවකවානු තුළ විවිධ සම්ප්‍රදායයන් යොදා ගනිමින් බුදුපිළිම නිර්මාණය වූ බව හඳුනාගත හැකි ය. බුදුපිළිමයේ පළමු වන ඉරියව්ව දැක්වීමේ දී එහි අඟපසඟවල ඇති ශෝභාව ද වඩාත් තීව්‍ර කරනු ලැබුවේ එහි චීවරය දක්වා ඇති පිළිවෙළ මත ය. ලක්දිව බුදුපිළිමයේ චීවරය පෙරවීමේ ක්‍රමය පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී එය ඉදිරිපත් කිරීමේ රටාවේ වෙනස්කම් දක්නට ලැබේ. බුදුරදුන් චීවරය පෙරවූ ආකාරය බෞද්ධ ග්‍රන්ථවල සඳහන් කර තිබේ. බෞද්ධ සාහිත්‍යමය මූලාශ්‍රයවල "බුදුරදුන් රත්නදුල්පට නිවාසනය හැඳ, කායබන්ධනය බැඳ, උත්තරාසංඝය සකස් කොට පොරවා, සංඝාටිය ගෙන විහාරයෙන් නික්ම වැඩම කරති" යි දක්වා තිබේ. බුදුපිළිමයක චීවරය පෙරවීමේ ක්‍රම තුනකි. එනම්, **ඒකාංශ, උභයාංශ හා අර්ධ උභයාංශ පාරුපන** වශයෙනි. මේ අතරින් ලක්දිව බුද්ධ ප්‍රතිමාවන්හි වඩාත් ජනප්‍රිය චීවරය පෙරවීමේ සම්ප්‍රදායය වී ඇත්තේ **ඒකාංශ පාරුපනය** බව පෙනේ. ඉපැරැණි ප්‍රතිමා වශයෙන් ගැනෙන **අනුරාධපුර සමාධි පිළිමය, තොලුවිල බුදුපිළිමය මෙන් ම මාලිගාවිල, තිස්සමහාරාමය, වෙහෙරගල හා පන්කුලිය** ආදී ස්ථානයන්හි දක්නට ලැබෙන බුදුපිළිමයන්හි ද චීවරය පෙරවීමේ සුවිශේෂ ලක්ෂණ දැකිය හැකි ය. බුද්ධ ප්‍රතිමාවන්හි විචිත්‍රත්වය කියා පෑමේ දී චීවරය රැළි ගැන්වීමේ ස්වරූපය ද ඉතා වැදගත් වන අතර එහි ද විවිධ ස්වරූපයන් දැකිය හැකි ය. තනි ඇලයේ රේඛා, දිය රැළි ක්‍රමයේ රේඛා හා කෙටි රැළි ආදිය එහි දී යොදා ගෙන ඇත. ලක්දිව සුපතළ බුදුපිළිමයන්හි චීවරයේ විචිත්‍රත්වය මැනවින් විදහා පෙන්වීමත් පැරැණි කලාකරුවාගේ කලා හැකියාවන් කෙතරම් ද යන්න ඔප්නංවා පෙන්වීමත් මෙහි මුඛ්‍ය පරමාර්ථය වේ. පර්යේෂණය සිදු කිරීමේ දී **දීඝනිකාය** ආදී මූලාශ්‍රය මෙන් ම ද්විතීයික හා තෘතීයික මූලාශ්‍රය ද භාවිත කරනු ලැබේ.

**ප්‍රමුඛ පද :** චීවරය, පාරුපනය, බුද්ධ ප්‍රතිමාව, විචිත්‍රත්වය, ශ්‍රී ලංකාව